# මුලටියන ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය
----------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර විකුණන ලද රු.2,380,000 ක් වටිනා මෝටර් රථ හා කරත්තවල ගත් මිල වටිනාකම ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව හිඟහිටි අක්කර බදු වටිනාකම රු.157,586 ක් වන අතර අක්කර බදු ලේඛනය හා හිඟ ආදායම් වාර්තාව (ප්‍රා.ස. 07) අනුව එකී වටිනාකම රු.70,342 කි. මේ අනුව අක්කර බදු හිඟය රු.87,244 කින් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) ගිණුම් අංක 72036816 දරන ස්ථාවර තැන්පතුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.167,671ක් වුවද ජර්නල් සටහන් අංක 11 මගින් පොලී ආදායම ලෙස රු.94,246 ක් පොලී ගිණුමට බැර කර තිබුණි. මේ අනුව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.73,425 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම් ණයගැතියෝ යටතේ බලපත්‍ර ගාස්තු හිඟයක් නොමැති වුවද හිඟ ආදායම් වාර්තාව අනුව හිඟය රු.10,450 ක් විය.

(ඉ) සභාවේ සේවක ඇප තැන්පත් වල වටිනාකම සේවක ඇප ආයෝජන වටිනාකමට සමාන විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සේවක ඇපවල වටිනාකම රු.55,686 ක් වූ අතර සේවක ඇප ආයෝජන වල වටිනාකම රු.29,886 වූයෙන් වෙනස රු.25,800 ක් විය.

(ඊ) ඉකුත් වර්ෂයේ සේවක ඇප තැන්පත් රු.25,800 ක මුදල විවිධ තැන්පත් ගිණුමට බැරවීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහන් අංක 21 මගින් නැවතත් සේවක ඇප ගිණුම හර කර විවිධ තැන්පත් ගිණුම බැර කිරීම නිසා එකී වටිනාකම ද්විගණනය වී තිබුණි.

(උ) සමලෝචිත වර්ෂයේ ජුනි 05 දින රු.12,400 කට මිලට ගෙන තිබුණු විදුලි පංකා 02 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,205,987 ක් වූ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.391,467 ක් වූ අතැති තොගයේ වටිනාකම වර්ගීකරණයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඉකුත් වර්ෂවල විගණන වාර්තාවලින් මෙම කරුණ පෙන්වා දුන්නද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 16 කට අදාලව ශේෂයන්ගේ එකතුව රු.10,690,721 ක් වූ අතර උපලේඛන හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වටිනාකම රු.9,364,175 ක් වූයෙන් වෙනස රු.1,326,546 ක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.36,288 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,936,076 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.81,200,714 ක් විය.

1.3.6 නිරවුල් නොකළ ගිණුම්

රු.18,058 ක් වටිනා ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.23.037,613 ක් වටිනා වත්කම් හා රු.77,757,457 ක් වටිනා බැරකම් සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා, අත්තිකාරම් ලේඛන හා කාල විශ්ලේෂණ වාර්තා යනාදිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.8 නීති, රීති , හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | රීති 217 සහ 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු.8,851,738 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු.7,225,252 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 556 | 34 | 141 |
| කුලී | 3,271 | 3,322 | 796 |
| වෙනත් ආදායම් | 35,143 | 30,719 | 2,569 |

2.2.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ බිල්කළ අක්කර බදු ආදායම රු.21,560 වන අතර වර්ෂය තුල බිල්කළ මුදලින් ලැබීම් රු.12,533 කි. මේ අනුව අයවීමේ ප්‍රගතිය සියයට 58 කි. ඉකුත් වර්ෂයේ හිඟහිටි අක්කර බදු ආදායම රු.65,761 ක් වූ අතර වර්ෂය තුල හිඟ මුදලින් ලැබීම් රු.5,121 කි. මේ අනුව හිඟහිටි අක්කර බදු ආදායමින් වර්ෂය තුල අයවීමේ ප්‍රගතිය සියයට 8 ක් තරම් සුළු අගයක් විය.

2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂයේ බිල්කළ බදුකුලී ආදායම රු.2,587,400 ක් වූ අතර වර්ෂය තුල බිල්කළ මුදලින් ලැබීම් රු.1,663,218 කි. මේ අනුව අයවීමේ ප්‍රගතිය සියයට 64 කි. ඉකුත් වර්ෂයේ හිඟහිටි මුදල රු.527,137 ක් වූ අතර හිඟ මුදලින් ලැබීම් රු.191,508 ක් වූ අතර හිඟ මුදලින් අයවීමේ ප්‍රගතිය සියයට 36 කි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 870,881 |
| (ආ) | මුද්දර ගාස්තු | 1,698,185 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.1.1 සේවක ණය

සභාවේ නිලධාරීන් තිදෙනෙකුගෙන් වර්ෂ කිහිපයක සිට අය නොවන සේවක ණය රු.15,307 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 වන විටද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.2 කල් ඉකුත් වූ තැන්පතු

සභාවේ තැන්පතු වශයෙන් රු.1,618,567 ක මුදලක් ඇති අතර එම තැන්පතු වර්ෂ දෙකකට වඩා කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබූ අතර ආදායමට එකතු කර ගෙන නොතිබුණි. එම තැන්පත් කළ රු.112,295 ක මුදලක් එකතු කළ අගය මත බදු වූ අතර එම මුදල 2008 වර්ෂයේ සිට තැන්පත් ගිණුමේ නිරවුල් කිරීමකින් තොරව රඳවා ගෙන තිබුණි.

3.1.3 උත්සව වියදම්

සභාව විසින් අවස්ථා 10 කදී උත්සව වියදම් වශයෙන් රු.53,347 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව අදාල අමාත්‍යවරයාගෙන් පූර්ව අනුඥාව ලබාගෙන නොතිබුණි.

3.1.4 අවිධිමත් ගනුදෙනු

සභාව මගින් සභාවේ ගමන් බිමන් සඳහා වෑන් රථ සඳහා කුලී වශයෙන් රු.171,930 ක මුදලක් ගෙවා තිබුණි. සභාව විසින් වෑන් රථ සඳහා ගෙවීමට මිලගණන් කැඳවාගෙන තිබුණේ 2014 ඔක්තෝබර් මාසයේදීය. එහෙත් 2014 ජනවාරි සිට වෑන් රථ සඳහා ගමන් ගාස්තු ගෙවා තිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 02 | 02 | - | - |
| ද්විතියික | 25 | 27 | - | 02 |
| ප්‍රාථමික | 28 | 29 | - | 01 |
| අනියම්, තාවකාලික, කොන්ත්‍රාත් | - | 02 | - | 02 |
| | 55 | 60 | - | 05 |

භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම් ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද සභාව 2014 වර්ෂයේදී සේවකයින් 02 දෙනෙකුට රු.1,386,643 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැයලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබුණු බව නිරීක්ෂණය නොවීය.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය